## ගරු විදුහල්පති පියතුමාගේ විද්‍යාල දැක්ම හා මෙහෙවර කරා යන පස් අවුරුදු සැලැස්ම

## 2014-2018 වර්ෂය සඳහා

ප්‍රෞඪ හා අනභිභවනීය ඉතිහාසයකට හිමිකම් කියන වෙන්/ජෝශප් වාස් විද්‍යාලය දෙව්ඳුන්ටත් , මව්බිමටත් ගෞරවාන්විතව සේවය කිරීමේ අභිමානවත් දැක්ම හා මෙහෙවර කරා නිරන්තරයෙන් ගමන් කරන ජනප්‍රිය වු කීර්තිමත් විද්‍යාලයකි. අප විද්‍යාලයේ ශ්‍රේෂ්ඨ නාමය නිති රැකෙන්නේ යථෝක්ත දැක්ම හා මෙහෙවර සඵල කරනුවස් ප්‍රධාන අංශ කීපයක් ඔස්සේ විදුහල් මාතාව පිය ඔසවන බැවිනි. අධ්‍යාපනයේ අති විශිෂ්ට අභිමාර්ථ සඵල කරනු සඳහා ශිෂ්‍ය ප්‍රජාවගේ ප්‍රගතිය වර්ධනය කිරීම මෙහිදී අති උදාර කාර්යයක් සේ සලකනු ලබයි එහිදී සිසු දරුවන්ගේ අධ්‍යාපනික, අධ්‍යාත්මික සමාජීය, සදාචාරාත්මක, විනයානුකූල සුසංවර්ධනය විධිමත්ව පියවරෙන් පියවර සිදුවිය යුතු බව අනිවාර්ය කාර්යයක් ලෙස සලකනු ලබයි එසේ එම උත්තරීතර අදිටන කරා සමීප වීමට නිශ්චිත කාල පරාසයක් ද අවධාරණය වෙයි. එම කාල රාමුව තුළ සිදු කරන කාර්ය භාරය හා එම කාර්යයන් වල සැලසුම් සහගත බවද, විනිවිදභාවය ද අත්‍යවශ්‍ය වේ. එහිදී මෙම වාර්ෂික සැලැස්මේ වටිනාකම හා අර්ථාන්විත භාවය අප පාසල් මාතාව ලද භාග්‍යයක් සේ සලකමි.

වෙන්/ජෝශප් වාස් විද්‍යාලය විශිෂ්ට අධ්‍යාපනික අරමුණු කරා සිසු දරුවන් රැගෙන යන්නේත්, ඒ කරා ළඟා කරවන්නේත් මෙම වාර්ෂික සැලැස්මට අනුගතවය. අතීතයේ විද්‍යාලයාධිපතීන්ද ජෝශප් වාස්  විද්‍යාලය අභිමානවත් ලෙස ඔසවා තබනු ලැබුවේ මෙවැනි අති සාර්ථක වු සැලසුම් අනුවය. එහෙත් වර්තමානයේ විශිෂ්ට වු අධ්‍යාපන අභිමතාර්ථ කරා ළඟා වීමට යෝග්‍ය වු වාර්ෂික සැලැසුම් නිර්මාණය කිරීම මා හට පැවරී ඇති බැරෑරුම් කර්තව්‍යකිග විශේෂයෙන්ම මෙම සැලසුම ඔස්සේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඉෂ්ට කර ගැනීමට අපේක්ෂා කරමු. අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක සංවර්ධනයට වඩා ගුණාත්මක අධ්‍යාපන සංකල්පය පුළුල් වුවක් බැවින් ඊට අදාළ සංවර්ධන ක්‍රියාවලීන් පහසුකරලීමට අවශ්‍ය කරන අධ්‍යාපන ප්‍රමිතීන්, ශිෂ්‍ය සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිමැවුම් සපයා ගැනීම, එකී යෙදවුම් කාර්යක්ෂමව හා සැලසුම් සහගතව භාවිත කිරීම, මෙම ක්‍රියාකාරීත්වය නියමුකරණයට ලක් කිරීම ආදිය කෙරෙහි මෙම වාර්ෂික සැලැස්මේ දී දැඩි අවධානයට ලක් කොට ඇත.

අතීතයේ සිට ජෝශප් වාස් විදුහල් මෑණියන්ගේ සිප්සතර ලැබ, ගුණ නුවණින් යුතු උසස් සමාජ තලයන්ට අවතීරණය වු වෛද්‍යවරු, ඉංජිනේවරු, ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයෝ, විශිෂ්ට වු කලාකරුවෝ, විවිධ ක්ෂේත්‍ර වල නියැලෙන බුද්ධිමත් ප්‍රාඥයෝ බොහෝ වෙති. මෙවැනි ආදි ජෝශප් වාස් විශිෂ්ට චරිත විද්‍යාලයට දක්වන ගෞරවාන්විත බවද පසක් කරමින් පාසලේ කුදුමහත් කටයුතු වලට දක්වන සහයෝගයද වත්මන් සිසු දරුවන් ලද භාග්‍යයකිග අප විද්‍යාලය තව දුරටත් ගුණාත්මකව සංවර්ධනය වී ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය තව දුරටත් පුළුල් වී එමගින් සිසුන්ගේ දැනුම්, ආකල්ප කුසලතා (ප්‍රජාතන, ආවේදන, මනෝචාලක) ක්ෂේත්‍රයන්ගේ කුසලතා ඔප් නංවා ගැනීමට මෙම වාර්ෂික සැලැස්මෙන් අවකාශය ලැබෙනු නොඅනුමානයි.

විශේෂයෙන් 2007 වර්ෂයේ හඳුන්වා දුන් නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශයන් සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් සිසුන් වෙත ළඟා කර දීමට මෙම වාර්ෂික සැලැස්මේ ප්‍රධාන ඉලක්කය බවටද පත් කොට ඇති බව පවසන්නේ ඉතා සතුටිනි. මේ අයුරින් ඉගෙනුම් ඉලගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කර ගැනීමද මෙහි මුඛ්‍ය පරමාර්ථය වී ඇති බවද කියනු කැමැත්තේමි. වර්තමානයේ අභියෝග ජය ගත හැකි බුද්ධිමත්වුත්, සදාචාරාත්මකවුත් සිසු පරපුරක් ජෝශප් වාස් විද්‍යාලයෙන් ලොවට දායාද කිරීමේ භාරදූර කාර්යය මෙම වාර්ෂික සැලැස්මේ අන්තර්ගතවීමද සතුටු විය හැකි කරුණකි.

සමස්ත අධයාපන ක්‍රියාවලිය නිසි පරිදි සැලසුම් සහගතව කළමණාකරණය කිරීම සඳහා පරිපාලනයේ නියුතු සැමගේ අධීක්ෂණයත්, කැපවීමත් සියලුම ගුරුවරුන්ගේ ඵලදායී හා කාර්යක්සම කැපවීමත්, දෙමාපිය සුබ පතන්නන්ගේ සහායෝගය හා විද්‍යාලයට දක්වන හෘදයාංගම සෙනෙහසත්, සිසු දරුවන්ගේ උත්සහායත්, ධෛර්ය හා කැපවීමත් අත්‍යවශ්‍යය. යථෝක්ත සියල්ලෙහි සාර්ථක බව රැඳී ඇත්තේ එතැන බව මම තදින් විශ්වාස කරමි.

අවසාන වශයෙන් මෙම වාර්ෂික සැලැස්ම සංවිධානය කර ගැනීමට උපදෙස් දුන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහ විශේෂයෙන් සැලසුම් අංශයේ අධ්‍යක්ෂිකා මියුරියල් පීරිස් මහත්මියටත්, ජෝශප් වාස් විද්‍යාලයීය සැලසුම් කමිටුවටත් මාගේ හදපිරි කෘතවේදීත්වය පුද කරමි.

ගරු විදුහල්පති පියතුමා